ඍණාත්මක සන්දර්භයන් තුළ එම සිදුවීම් වලට අදාළ නොවන අවස්ථාවන්හිදී ඊට සම්බන්ධ සැකකරුවන්ගේ/වරදකරුවන්ගේ වාර්ගිකත්වයන් සඳහන් කිරීම මගින්, එම වාර්ගිකත්වයන් ඍණාත්මක ලෙස ඒකාකෘතික කිරීම් වලට ලක් විය හැක. යම් පුවතකට ඍජුවම අදාළ නොවන්නේ නම් අයෙකුගේ වාර්ගිකත්වය සඳහන් නොකළ යුතු බවට මාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වෙන්නේ ඒ හෙයිනි.
නමුත් මෙම මාධ්‍ය ආචාර ධර්මය උල්ලංඝනය කෙරෙනා අවස්ථාවන්ද තවමත් මාධ්‍ය තුළ දක්නට ලැබේ.
උදාහරණ ලෙස මෙම පුවත් වාර්තාවන් ගනිමු. දිවයින පුවත්පතේ (07/13) ඝාතනයක් සහ දිවි තොර කරගැනීමේ උත්සාහයක් සම්බන්ධයෙන් සඳහන් කරනා විට, අදාළ තැනැත්තියගේ නම සඳහන් කර, ඉන් අනතුරුව ඇගේ වාර්ගිකත්වයද "දෙමළ" යැයි සඳහන් කරයි. එසේම දිවයින ඉරිදා සංග්‍රහයේ (07/18) දැක්වෙන පුවතක සැකකරුවන් පෙළක්ම ගැන සඳහන් කළත්, එයින් එක් සැකකරුවෙකුගේ පමණක් වාර්ගිකත්වය "මුස්ලිම්" යැයි හුවා දක්වයි.
මේ කිසිසේත්ම වගකීම් සහගත මාධ්‍යකරණය වේද? මේ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීමක් නොවේද?
හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
#MediaEthicsSL #lka #sinhalanews #Divaina #SundayDivaina